# විදුලිය කපන්න වෙන්නෙ බලාගාර හදපු නැති නිසා

රටේ වැඩිවන විදුලි බල ඉල්ලුම සඳහා විසඳුමක් වන කිසිදු බලාගාරයක් ඉදි නොකිරීමත් ඉදිකිරීමට සූදානමින් තිබූ බලාගාර නවතා දැමීමත්, ඉංජිනේරුවන්ගේ සැලසුම් ඉවතදමා ව්‍යාපාරික සැලසුම් ක්‍රියාත්මක කිරීමට යාමත් නිසා මේ වනවිට විදුලිබල ක්ෂේත්‍රය දැවැන්ත අර්බුදයකට ඇද දමා ඇත. සැලසුම් සහගත කණ්ඩායම් විසින් ලං.වි.ම. සැලසුම් කරන ලද බලාගාර මෙලෙස නවතා දැමීමත් ප්‍රමාද කිරීමත් සිදුකරනු ලබන්නේ තමන්ට වාසි ගෙනෙන ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහායි. ව්‍යාපාරික හිතවතුන් සමග ඩීල් දමා පිල් බෙදී කඹ ඇදීම, තරගකාරී ටෙන්ඩර් ප්‍රමාද කර ඩීල් හරහා වවාගෙන කෑම, අර්බුදයකට තල්ලුකර බොරදියේ මාළු බෑම මොවුන් සිදුකරයි. රටේ ප්‍රබල දේශපාලන බලවතුන්, අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන්, ස්වාධීනයයි කියාගන්නා උපයෝගීතා කොමිසමේ ඇතැම් දූෂිත සාමාජිකයින් හා නිලධාරීන් මෙම කණ්ඩායම් නියෝජනය කිරීම රටේ අභාග්‍ය බව කිවයුතුයි.

වසරකට මෙ.වො 150 – 200 අතර ප්‍රමාණයක් අළුතින් ස්ථාවර බලාගාර පද්ධතියට එකතුවිය යුතුව තිබියදී එය කරගැනීමට අපහොසත්ව, විදුලිය කැපීමට හේතුව පෑවිල්ල හෝ නොරොච්චෝල බලාගාරයේ යන්ත්‍රයක ඇතිවූ දෝෂයක් බව ප්‍රකාශ කිරීම ජනතාව ගොනාට ඇන්දවීමට කරන ප්‍රයත්නයකි.

## අවුරුදු 4ක් තිස්සේ බලාගාර හදන සැලසුම් අනුමත නොකර පමා කලා

විදුලි බල පනත හා රටේ නීතිය අනුව රටට අවශ්‍ය බලාගාර සැදිය යුත්තේ අනුමත "දීර්ඝ කාලීන අඩු වියදම් විදුලි ජනන (බලාගාර) සැලැස්ම" අනුවයි. මෙම සැලැස්ම ලං.වි.ම. සැලසුම් ඉංජිනේරුවන් සකසන අතර එය නීතිගත වීමට මහජන උපයෝගීතා කොමිසම අනුමත කලයුතුයි. නමුත් රටේ අවාසනාවට ඉහලම පුටුවල සිටින දේශපාලන ප්‍රබලයන් 2014 සිට නීති විරෝධී ලෙස අප සැලසුම් අවුල් කිරීමටත් එහි ඇති බලාගාර නවතා දැමීමටත් ප්‍රමාද කිරීමටත් උපයෝගීතා කොමිසමේ දූෂිත නිලධාරී කිහිප දෙනෙකු යොදා ගන්නා ලදී. 2018 වසරේදී ලං.වි.ම. සැකසූ "දීර්ඝ කාලීන අඩු වියදම් විදුලි ජනන සැලැස්ම" කොමිසම විසින් අනුමත කලේ අප සංගමය දැඩි වෘත්තීය සමිති ක්‍රියාමාර්ග වලට එළඹීමෙන් පසුවයි.

බලාගාර සැලසුම් සෑදීමේදී සහ අනුමත කිරීමේදී පසුගිය වසර කිහිපය තුලම උපයෝගීතා කොමිසම ක්‍රියාකර ඇති ආකාරය නීති විරෝධී බව හා ඔවුන් අදාළ පනත් උල්ලංගනය කර ඇති බව නීතිපතිතුමා විසින්ද 2018 වසරේදී තහවුරු කරන ලදී. අවසානයේ කොමිසමේ දූෂිත අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉවත්කරනලද නමුත් මේවනවිට කොමිසම මගින් ඔහුව නැවත පත්කර ඇත. ජනාධිපතිවරයා පසුගිය මාර්තු 26 දින පැවති කැබිනට් මණ්ඩලයේදීද උපයෝගීතා කොමිසමේ දූෂිත ක්‍රියාකලාපය දැඩිව විවේච්චනය කර, ඉවත්කරන ලද කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මාස තුනකට පසු නැවත පත්කිරීම පිළිබඳ ප්‍රශ්න කර තිබූ බව සියලුම මධ්‍යවල පලවී තිබුනි.

## නොරෝච්චිලේට පසුව ඉදිකිරීමට තිබුණු දැවැන්තම බලාගාරය නැවත්වීම

නොරොච්චෝලේ බලාගාරයට පසුව ලං.වි.ම. සැලසුම්වලට අනුව ඉදිවීමට නියමිතව තිබුණු දැවැන්තම බලාගාරය මෙ.වො.500 සාම්පූර් බලාගාරයයි. එය 2020 දී පමණ සදා නිමකිරීමට සියලු කටයුතු සුදානම්ව පැවතුනි. තමන්ට වාසි ගෙනෙන නීතිවිරෝධී බලාගාර ඉදිකිරීමට බලාපොරොත්තු ඇතිව මෙම කණ්ඩායම සැලසුම් සහගතව සාම්පූර් බලාගාරය නවත්වයි. මෙය දැනට ජනාධිපති තුමා විසින් විසුරුවා ඇති ආර්ථික කළමනාකරණය පිලිබඳ කැබිනට් අනුකමිටුව (CCEM එක), ජනාධිපති උපදේශක වරු, අප අමාත්‍යංශයේ ඉහලම නිලධාරීන් හා මහජන උපයෝගීතා කොමිසම රටේ සංවර්ධනයට අකුල්හෙළන රාජ්‍ය නොවන සංවිධාන හා මොවුන්ට හිතවත් ව්‍යාපාරිකයින් එක්ව සිදුකරණ ලදී.

2034 දක්වා ලං.වි.ම. සැකසූ 20 අවුරුදු ජනන සැලැස්ම 2015 අගෝ. 06 දින උපයෝගීතා කොමිසමේ අනුමැතියට යැවුවද සැලැස්මෙන් සාම්පූර් ඉවත් කිරීමට අවස්තාව එනතෙක් වසරකට වැඩි කාලයක් සැලැස්ම අනුමත නොකොට තබාගන්නා කොමිසම ඇතුළු කණ්ඩායම සාම්පූර් ඉවත්කිරීමෙන් පසු 2016 සැප්. 15 දින එම සැලසුමේ තිබුණු තෙල් බලාගාර කිහිපයක් පමණක් අනුමත කර එවයි. එලෙස සැලැස්මේ කොටසක් පමණක් අනුමත කිරීම පනත අනුව නීති විරෝධී බැවින් සාම්පූර් නැවත්වීමට අමතරව බලාගාර ඉදිකිරීමට ලං.වි.ම. ට නීතිමය සැලැස්මක් නොමැති වීමද දැවැන්ත ගැටළුවක් විය.

බලාගාර නැතිව ලයිට් කපන්න වෙනකම් මේ බලාගාර වල අවශ්‍යතාවය පාලකයන්ට නොදැනෙන්නේ රටේ අවාසනාවටයි.

## තරගකාරී මිල ගණන් කැඳවූ මෙ.වො.300 ස්වභාවික වායු (LNG) බලාගාරය ප්‍රමාද ඇයි ?

අපේ සැලසුම් අනුව මෙම බලාගාරයේ මෙ.වො.230 ක් පද්දතියට එකතුවෙන්න තිබුනේ 2019 වර්ෂයේ. මේ සඳහා සමාගම් 8 ක් මිලගනන් ඉදිරිපත් කලත් 2017 වර්ෂයේදී ඉහලම මිලක් සහිත කොරියන් සමාගමක ටෙන්ඩරය පමණක් විවෘත කිරීමට බලධාරීන් උත්සහ කරද්දී ඉංජිනේරු සංගමයද ඒ සඳහා විරුද්ධ වී සියලු ටෙන්ඩර් පත් විවෘත කර තරංගකාරී මිලක් ලබාගැනීමට හැකිවිය. නමුත් විවිධ දේශපාලන බලවතුන්ගේ මැදිහත් වීම්, ටෙන්ඩර් මණ්ඩල වලට කරන ලද බලපෑම් හා අමාත්‍යංශයේ ඇතැම් ඉහල නිලධාරීන්ගේ අත්තනෝමතික ක්‍රියාවන් නිසා මෙම ටෙන්ඩරයේ තීරණය මේවනවිට උසාවියට භාරවී ඇත. මෙම ටෙන්ඩරය නිසා ටෙන්ඩර් මණ්ඩල වල නිලධාරීන් මාස කිහිපයක් ඇතුලත ඉල්ලා අස්වීම සහ කිහිපවතාවක්ම වෙනස් කිරීම මේ සඳහා දේශපාලන බලවතුන්ගේ මැදිහත්වීම කෙතරම්ද යන්නට කදිම නිදසුනකි. මේ සඳහා මැදිහත්වී සුදුසු සමාගමක් මගින් රටට අවශ්‍ය මෙම දැවැන්ත බලාගාරය ඉදිකරවාගැනීම වෙනුවට තමන්ට වාසිගෙන එන කණ්ඩායම්වලට ටෙන්ඩරය ලබාදීමට බලධාරීන්ගේ හා දේශපාලන බලවතුන්ගේ කඹ ඇදීම මෙම තත්වයට හේතුවයි.

## මේ අතර ජපානය, ඉන්දියාව හා චීනයේ සමාගම් තුනක් මගින් LNG බලාගාර තුනක් සෑදීමට රජය උත්සාහ කරයි.

මෙම බලාගාර ඉදිරි සැලසුම් වලට ඇතුලත් කිරීමට රජය යෝජනා කලත් එම සමාගම් විසින් ක්‍රමවත් තාක්ෂණික යෝජනාවක් හෝ විදුලිය විකුණන මිල පිළිබඳව කිසිඳු යෝජනාවක් මේ වනතෙක් ලබාදී නොමැති නිසා සාකච්ඡා ආරම්භකළ නොහැකිව තිබේ.

තරගකාරීව මිල කඳවු බලාගාර අනවශ්‍ය ලෙස වසර ගණන් පමා කිරීමට ප්‍රභල හේතුවක් වී ඇත්තේ මේ ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව එන යෝජනාවලට  වැඩි මිලක් ලබාදීමට මින් වාසි ලබන කණ්ඩායම් දියත්කර ඇති කුමන්ත්‍රණයක් නිසා  බවද පෙනීයයි.

## දිනෙන් දින පමාවන මද්‍යකාලීන විසඳුම්

ජනතාවට අඩුමිලට ස්ථාවර විදුලියක් ලබාදීමට හැකිවන්නේ  විදුලි ඒකකයක මිළ රු 9ක් පමණ වන  ගල්අඟුරු  හා රු 14 ක් පමණ වන ස්වභාවික වායු (LNG) බලාගාර  අඩංගු, දිගුකාලින අඩුවියදම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙන්ම පමණි. නමුත් එය ක්‍රියාවට නැංවීම  කඩාකප්පල් කරනලද තත්වයකදී අවම වශයෙන් තරමක් මිළ වැඩි මධ්‍යකාලීන විසඳුම් හෝ ක්‍රියාත්මක කලයුතුය. මධ්‍යකාලීන විසදුම් වන්නේ මිළ අඩු බලාගාර ඉදිවනතෙක්  විදුලි ඒකකයකට රු 20 - රු 24 පමණ වියදම් වෙන දැවී තෙල් බලාගාර මගින් විදුලිය ලබාගැනීමයි. නමුත් මද්‍යකාලීන විසඳුම් යටතේ ලං.වි.ම. සැලසුම් කල මෙ.වො.100 හා මෙ.වො.24x4 දැවි තෙල් බලාගාරවලට අදාළ ටෙන්ඩර් පොත් අනුමත කිරීම අමාත්‍යාංශය දිනෙන් දින පමා කරයි. අනුමැතිය සඳහා යොමුකර මාස 4 ක් පමණ ගතවුවත් අමාත්‍යාංශ නිලධාරීන් විවිධ පාර්ශව වල අවශ්‍යතාව අනුව එහි ඇති තාක්ෂණික කරුණු වෙනස් කිරීමට යෝජනා කරමින් ප්‍රමාද කරයි. ඒසේම වසර කිහිපයකට පෙර ගිවිසුම අවසන්වී නවතා ඇති මෙ.වො. 70 විදුලිබලයක් ලබාගත හැකි Ace මාතර හා Asia Power බලාගාර පිළිබඳවද අවුරුදු 2ක් පමණ තීරණයක් නොගෙන අමාත්‍යාංශය කල් මරමින් සිටියේය.

සැලසුම් කර ඇති අඩු වියදම්  ගල් අඟුරු හා ස්වභාවික වායු (LNG) බලාගාර ප්‍රමාදවීම නිසා ගෙනආ මධ්‍යකාලීන විසඳුම්ද  මෙලෙස පමාවීමෙන් සිදුවන්නේ ඒකකයක් රු 30 පමණවන  හදිසි ඩිසල් විදුලි බලාගාර (Emergency Power) ගැනීමට සිදුවීමයි.

## විදුලිය කපා මහජනතාව දැඩි අපහසුතාවයට පත්නොකර සිටීමට විදියක් තිබුනෙම නැද්ද ?

ඉංජිනේරුවන් සකසන විසිඅවුරුදු දිගුකාලින අඩුවියදම් සැලැස්ම හා මධ්‍යකාලීන විසඳුම්යන දෙකම කඩාකප්පල්වූ තත්වයකකදී ඉතිරිවන්නේ විකල්ප දෙකකි. එකක් ජනතාව අපහසුතාවයට පත්කරමින් විදුලිය කැපීමයි, නැත්නම් සල්ලි පුච්චමින් හදිසි විදුලිය ගැනීමයි. මේ වසරේ ජනවාරි මුල් සතියවනවිට මේ දෙකෙන් එකක් සිදුකිරීමට සිදුවනබව ලං.වි.ම පාලනාධිකාරිය අමාත්‍යාංශයට පැහැදිලිව දන්වාතිබුණි. ඒ අනුව හදිසි විදුලිය ගැනීමට ටෙන්ඩර් කැඳවා තෝරාගත් සමාගම් තුනකින් මාර්තු 15 වනවිට හදිසි විදුලිය ගෙන විදුලි කප්පාදුව මගහැරීමට උත්සහ කලත්, ලං.වි.ම. උපදෙස් කුණුකුඩයට දැමු

අමාත්‍යාංශය ව්‍යාපාරිකයින්ගේ නොයෙකුත් යෝජනා ක්‍රියාත්මක කිරීමට උත්සහකිරීම නිසා ලයිට් කැපීම නොවැලැක්විය හැකිවිය.

විදුලි කැපීම සිදුකිරීම අනිවාර්යයෙන් සිදුකල යුතු තත්වයට පැමිණි විට ලං.වි.ම. සාමාන්‍යාධිකාරීවරයා විසින් මේ බව 2019 මාර්තු 6 දින අධ්‍යක්ෂක මණ්ඩලයට හේතු සහිතව ඉදිරිපත්කල අතර 2019 මාර්තු 18 දින විදුලි කැපීම සඳහා ලිපියක් මගින් අමාත්‍යංශ අනුමැතිය ඉල්ලා ඇත.

මෙහිදී අප සැලකිල්ලට ගතයුතු තත්වය වන්නේ දිගුකාලින සැලැස්ම, මධ්‍යකාලීන විසඳුම සහ අවසානයේ හදිසි සැලැස්ම පවා අවුල් කිරීමට ඇත්තේ පොදු කරුණකි. එනම් කොයි ආකාරයෙන් වුවද සාධාරණ ටෙන්ඩර් කැඳවීම අමාත්‍යාංශ ඉහල නිලධාරීන්ට හා දේශපාලකයින්ට නයාට අඳුකොළසේ අරහංය. කාරණාව ජනතාව හොඳින්ම දනිති.

## බොරදියේ මාළුබෑම

ලයිට් කැපිල්ල පටන්ගත්විට ටෙන්ඩර් නොකැඳවා විදුලිය මිලදී ගැනීමට විදුලිබල පනතින්ද අවකාශ සලසා ඇත. නියගය පැමිණ විදුලිය කැපෙන තෙක් මධ්‍යකාලීන හා කෙටිකාලීන විසඳුම් පමාකරමින් සිටි බලධාරීන් හදිසි තත්වය යටතේ ටෙන්ඩර් කැඳවීමකින් තොරව විදුලිය ලබාගැනීමට ඉතා කඩිනමින් ක්‍රියාත්මක වී සිටියි.

විශාල ප්‍රමාණයේ අඩු වියදම් තාප බලාගාර ඉදිනොකර තනිකරම සූර්ය බලාගාර මගින් මේ විදුලි අර්බුධය විසඳිය හැකි බවත්, මණ්ඩලයේ නිලධාරීන් හදිසි විදුලිය මිලදී ගැනීමට අවශ්‍ය නිසා ඔවුන්ගේ බලාගාර ගැන උනන්දුවක් නොමැති බවට ප්‍රචාරයක්ද තිබේ. ස්ථාවර (තාප හෝ විශාල ජල විදුලි) බලාගාර නොමැතිව සූර්ය හා සුළං බලාගාරවලින් පමණක් මෙවැනි අර්බුධයක් වලකවාගත නොහැකි උවත් , පරිසර හිතකාමී පුනර්ජනනීය විදුලිය වැඩිදියුණු කිරීමට ලං.වි.ම විශාල ක්‍රියාදාමයන් සිදුකර ඇත. දැනට විශාල සූර්ය බලාගාර සඳහා ටෙන්ඩර් කැඳවා පුද්ගලික අංශයෙන් රු 14-16 අතර මුදලකට මෙ.වො. 200 ක් පමණ පද්ධතියට එකතුවීමට නියමිතය. සූර්ය බල සංග්‍රාමය යටතේ නිවෙස් වල වහල මත ඇති සූර්ය බල ධාරිතාව මෙ.වො. 170 ඉක්මවා ඇත. මේවන විට මෙ.වො. 130 පමණ සුළං බලාගාර ක්‍රියාත්මක තත්වයේ ඇති අතර තවත් මෙ.වො. 100 ක දැවැන්ත සුළං බලාගාරයක් ලබන වසරේ පද්ධතියට එක්වීමට නියමිතය.

ලං.වි.ම. ඉංජිනේරු සංගමය සැමවිටම පෙනී සිටින්නේ ජනතාව සඳහා අඩු වියදමට අඛණ්ඩව විදුලය ලබාදීමටයි. විදුලිබල ක්ෂේත්‍රය අර්බුදයෙන් මුදවාගැනීමට තිරසාර විසඳුම් ලබාදීමට ක්‍රියා නොකොට බොරදියේ මාළු බෑමට ගොස් ජනතාව කබලෙන් ලිපට දැමීමට උත්සහ කළහොත් අප දැඩි වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට එළඹෙන බව බලධාරීන්ට දන්වා සිටිමු.

ලංකා විදුලිබල මණ්ඩල ඉංජිනේරු සංගමය
இலங்கை மின்சார சபை பொறியியலாளர்கள் சங்கம்
CEYLON ELECTRICITY BOARD ENGINEERS' UNION
Registered under the Trade Unions Ordinance: Registration No. 770